# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1913/8 - 2015 මැයි මස 06 වැනි බදාදා - 2015.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික සත්වෝද්‍යාන පනත

1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 8 වන වගන්තිය යටතේ සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල පිහිටුවා ඇති අතර සත්වෝද්‍යාන නැරඹීමේ ප්‍රවේශ පත්‍ර ගාස්තු එකී අරමුදලට බැර කරනු ලබයි. මහජනයා සඳහා අලුතින් විවෘත කරන ලද පින්නවල නව සත්වෝද්‍යානයේ ඇතුළුවීමේ ගාස්තු 2015.05.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

එම්. අයි. එම්. රෆීක්,
ලේකම්,
සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය.

2015 අප්‍රේල් මස 23 වන දින.

නියෝග

2015.05.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පින්නවල නව සත්වෝද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන දේශීය හා විදේශීය නරඹන්නන්ගෙන් පහත පරිදි ප්‍රවේශ පත්‍ර ගාස්තු අය කරනු ලැබේ.

| *අංකය* | *ප්‍රවේශ පත්‍ර වර්ගය* | *ගාස්තුව රු.* |
|---|---|---|
| 01 | දේශීය වැඩිහිටි | 100/- |
| 02 | දේශීය ළමා | 30/- |
| 03 | දේශීය පාසැල් කණ්ඩායම් සඳහා (එක් අයකුට) | 20/- |
| 04 | විදේශීය වැඩිහිටි | 1000/- |
| 05 | විදේශීය ළමා | 500/- |
| 06 | විදේශීය (සාර්ක්) වැඩිහිටි | 500/- |
| 07 | විදේශීය (සාර්ක්) ළමා | 250/- |

** අර්ථ නිරූපනය

වැඩිහිටි - වයස අවුරුදු 12 ට වැඩි ළමුන් ඇතුළු සියළු පුද්ගලයින්

ළමා - වයස අවුරුදු 3ට වැඩි සහ අවුරුදු 12 ට අඩු

05 - 441

1A - G 21480 — 16 (2015/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*